<u>**පාණදුර නගර සභාව - මිල සැදහුම් කැදවීමයි.**</u>

1. මෙහි පහත උපලේඛණයේ සදහන් ව්‍යාපෘති ඉටු කරවීම සදහා මෙම සභාවේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් පමණක් පිටපත් දෙකකින් යුතුව මිල සැදහුම් කැදවනු ලැබේ.
2. ඔබ වෙත එවනු ලබන මෙම මිල සැදහුම් කැදවීමේ නිවේදනයේ දක්වා ඇති ව්‍යාපෘති ඉටු කිරීම සදහා ඔබට මිල සැදහුම් ඉදිරිපත් කළ හැකි අතර,මෙම සභාවේ ඔබ විසින් ලියාපදිංචි වී ඇති මුල්‍ය සීමාව තුළට ගැනෙන පහත සදහන් ව්‍යාපෘති සදහා පමණක් ඔබ වෙත මිල සැදහුම් ලේඛණ නිකුත් කරනු ලැබේ.
3. ඔබ විසින් මෙම ව්‍යාපෘති සදහා මිල සැදහුම් ඉදිරිපත් කිරීමට කැමැත්තක් දක්වා සිටින්නේ නම්,අදාල **ව්‍යාපෘති මිල සැදැහුම් ලේඛන පිටපත් දෙකකින් යුතුව 2025.09.19 වන දින සිට 2025.09.25 වන දින ප.ව.3.00 දක්වා** මිල සැදැහුම් ලේඛන ගාස්තු වශයෙන් මෙහි පහත සදහන් ව්‍යාපෘති ඉදිරියේ දැක්වෙන ගාස්තු වලංගු මුදලින් පමණක් ගෙවා කර්මාන්ත අංශයෙන් ලබා ගත හැකිය.(ආපසු ගෙවන ඇප තැන්පත් මුදල ඇස්තමේන්තුගත මුදලින් 1%ක් වශයෙන් තැන්පත් කළ යුතුය).
4. එසේ ලබා ගන්නා ලද මිල සැදැහුම් ලේඛන නිසි ලෙස සම්පූර්ණ කර පිටපත් දෙකකින් යුතුව ,එනම් මුල් පිටපත හා අනු පිටපත වශයෙන් වෙන වෙනම කවර වල බහා එම කවර දෙක නැවත එක් කවරයක බහා **2025.09.26 වන දින පෙ.ව.10.00**ට ප්‍රථම ලේකම් , නගර සභාව, පාණදුර යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල මගින් හෝ අතින් ගෙනවිත් පාණදුර නගර සභාවේ ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම මගින් හෝ ලැබීමට සැලැස්වීම මගින් ඉදිරිපත් කළ හැකිය.
5. තවද,මිල සැදැහුම් ලේඛන ඉදිරිපත් කිරීමේදී මිල සැදැහුම් ලේඛන සමග නිකුත් කරනු ලබන ලංසු කොන්දේසි කියවා මැනවින් පිළිපැදීමට සටහන් කර ගත යුතුය.
6. මිල සැදැහුම් ලේඛන බහාලන කවරයේ **ඉහළ වම් කෙළවරේ ව්‍යාපෘති අංකය සහ නම සමග මිල සැදැහුම් යනුවෙන් සදහන් කළ යුතු අතර**,මිල සැදැහුම් බහාලන කවර නිසි ලෙස අලවා තිබිය යුතුය.
7. එසේම නියමිත දින නියමිත වේලාවට පසුව ලැබෙන හා නියමිත මිල සැදැහම් ලේඛන මගින් ඉදිරිපත් නොකරන මිල සැදැහුම් ප්‍රතික්ෂේප කරනු ලබන අතර,සියලුම මිල සැදැහුම් හෝ එහි කොටසක් හෝ පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය සම්පූර්ණයෙන් හෝ මිල සැදැහුම් කැදවීමේ අස්තිත්වය වන සභාව සතු වේ.
8. මිල සැදැහුම් විවෘත කිරීම **2025.09.26 දින පෙ.ව.10.05**ට සිදු කරනු ලබන අතර,එම අවස්ථාවට මිල සැදැහුම් ඉදිරිපත් කළ ලංසුකරුට හෝ ඔහුගේ ලිඛිත බලයලත් නියෝජිතයෙකුට හෝ අදාළ ප්‍රසම්පාදන කමිටුව ඉදිරියේ පෙනීසිටිය හැකිය.
9. ඔබගේ මිල සැදැහුම් පිළිගතහොත් , ඒ බවට දැනුම් දුන් වහාම මෙම සභාව සමග පොරොන්දු ගිවිසුමකට ඇතුලත් විය යුතු අතර,ගිවිසුමේ සදහන් කරනු ලබන කාලය ඇතුලත අදාල ව්‍යාපෘතියේ සියළුම වැඩ අදාල තාක්ෂණ නිලධාරීගේ අධික්ෂණය යටතේ සතුටුදායක ලෙස නිමකර සභාව වෙත භාර දිය යුතුය.

ව්‍යාපෘති උප ලේඛනය

| අනු අංකය | ව්‍යාපෘති අංකය | ව්‍යාපෘතියේ නම | ඇස්තමේන්තු මුදල (වැට් සහ අවිනිශ්චිත මුදල සමග) | ආපසු නොගෙවන පෝරම ගාස්තු |
|---|---|---|---|---|
| **1** | **A256183141002** | **පාණදුර නගර සභාවට අයත් 685 පට්ටිය උතුර ග්‍රාම නිලධාරී වසමේ නගර ශාලා ගොඩනැගිල්ලේ ඉදිරිපස කොටස නවීකරණය.** | **රු.5,000,000.00** | **රු.2500.00** |
| **2** | **H258183141001** | **පාණදුර නගර සභාවට අයත් 681 තන්තිරිමුල්ල ග්‍රාම නිලධාරි වසමේ තන්තිරිමුල්ල පුස්තකාලය පහළ මහළ ඉදි කිරීම.** | **රු.6,000,000.00** | **රු.3000.00** |
| **3** | **S253189341002** | **පානදුර නගර සභාවට අයත් මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි අනුස්මරණ මහජන පුස්තකාලයේ ප්‍රධාන ගොඩනැගිල්ලේ තීන්ත ආලේප කිරීම** | **Rs.800,000.00** | **රු.1500.00** |

2025.සැප්තැම්බර් 17 වනදින,
පාණදුර නගර සභාවේදී,

............................
ලේකම්,
පාණදුර නගර සභාව.